කාන්තාව හා මාධ්‍ය සාමූහිකය
பெண்கள் தொடர்பு ஊடகங்களுக்கான கூட்டமைப்பு
Women and Media Collective
1984 2009

2009 අගෝස්තු 20 වන දින දිවයින පුවත්පතේ 21 වන පිටුවේ පළවූ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සිංහල අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අත්තනායක එම්. හේරත් මහතා අ.පො.ස. උසස් පෙළ සිසුන් අමතා වරකාපොළදී කළ කතාව පිළිබඳ වූ සටහන දැක කාන්තාවන් වෙනුවෙන් පෙනී සිටින කාන්තා සංවිධානක් වන අප බොහෝ කණගාටුවට පත්වුණෙමු.

අප රට තුළ විශාල ජන ප්‍රසාදයකට පාත්‍ර වූ විශ්ව විද්‍යාල කථිකාචාර්යවරයෙකු වන ඔබ, දිවයින පත්‍රයේ පළ වූ සටහනට අනුව වරකාපොළදී කළ කතාවේදී ගැහැණු ළමයින්ගේ අධ්‍යාපන මට්ටම පිරිමි ළමුන්ගේ අධ්‍යාපන මට්ටම අබිබවා යන බවත් එසේ වූ විට විවාහයක දී ගැහැණු ළමුන්ට තම සහකාරයාගේ අධ්‍යාපන මට්ටම ඇයට වඩා අවම වීම සමාජීය ගැටළුවක් බවට පත්වන බවටත් කරුණු දක්වා ඇත. එමෙන්ම ඔබ **'පේරාදෙණිය හා මොරටුව ඉංජිනේරු පීඨවල එදා දුවලා හිටියේ නෑ, දැන් ඒවාටත් මේක බෝවෙලා'** යනුවෙන් විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨවල ශිෂ්‍යාවන්ගේ සංඛ්‍යාව වැඩිවීම හෙළා දකිමින් කතා කර ඇත. අපේ පොදු ජනවහරේ දී අප 'බෝ වෙනවා' යනුවෙන් හඳුන්වන්නේ වසංගත රෝග බෝවීම, කෘමි උවදුරු බෝවීම වැනි උවදුරු හා විපත්වලටය. ඒ අනුව විශ්ව විද්‍යාලවල ශිෂ්‍යාවන්ගේ සංඛ්‍යාව වැඩිවීම ඔබේ මතයට අනුව 'බෝ වීමක්' බවට පත්ව ඇත.

වසර 2009 හඳුන්වා දී ඇත්තේ තොරතුරු ග්‍රහණය කරගැනීමේ වසර (access to knowledge) ලෙස බව ඔබත් දන්නා කරුණකි. එය එසේ නම් රටක ඉංජිනේරු, වෛද්‍ය, විදුහල්පති, ගුරු, ප්‍රාදේශීය ලේකම් තනතුරුවලට වැඩි වැඩියෙන් කාන්තා සහභාගිත්වය ලැබෙන්නේ රටේ තරුණ දැරිවියන් තම අධ්‍යාපන කටුයතු නිසිසේ ඉටු කරන බැවින් බව ඔබේ කතාවෙන්ම පැහැදිලි වේ. රටක දරුවන්ගේ සාක්ෂරතාවය, අධ්‍යාපනය හා නිපුණතා මට්ටම වැඩිවීම ගැහැණු/පිරිමි වශයෙන් පංගු කර නොබලා එය රටක සමස්ත දියුණුවක ප්‍රතිඵලයක් වශයෙන් සැලකීම ඔබ වැනි උගත් කථිකාචාර්යවරයෙකුගේ යුතුකම බව අපේ හැඟීමයි.

වරකාපොළ දී ඔබ විසින් පැවැත්වූ උක්ත කතාවේ දී සමජයක උගතුන් සම සමව සිටිය යුතු බවටත් අද අපේ රටේ උගතුන්ගේ ප්‍රමාණයෙන් උගත් ගැහැණු ප්‍රතිශතය වැඩි වී ඇති බවත් ඔබ ප්‍රකාශ කර ඇත. **'මෙහෙම ගියොත් අපේ රටේ පුත්තු ගෘහමූලික ලැයිස්තුවේ දෙවන තැනට වැටෙනවා'** යනුවෙන්ද ඔබ ප්‍රකාශ කර ඇත. ගෘහ මූලිකයා යනු පවුලක වගකීම් ඉටුකරමින් දරුවන් පෝෂණය කරමින් එය රැකබලාගනු ලබන පුද්ගලයා බව අපේ හැඟීමයි. යම් පවුලක එම යුතුකම කාන්තාවක් විසින් ඉටු කරනු ලබන්නේ නම් ගෘහ මූලික ලැයිස්තුවට ගෘහමූලිකයා ලෙස ඇගේ නම ඇතුළත් කළ යුතු බව ද අපේ හැඟීමයි. නොඑසේම පවුලක යුතුකම් ඉටු නොකරන/පවුලක් නඩත්තු නොකර පිරිමි ගෘහ මූලික ලැයිස්තුවේ ගෘහමූලික තනතුරට පමණක් එක් කරන කරුණ කිම?

174, අල්විස් මාවත, කාසල් වීදිය, කොළඹ 8, ශ්‍රී ලංකාව
அல்விஸ் ஒழுங்கை, காசல் வீதி, கொழும்பு 8, இலங்கை.
Alwis Avenue, Castle Street, Colombo 8, Sri Lanka
Telephone: +94-11- 2690201, 5635900,5635800, 5632045 Fax: +94-11-2690192 E-mail: womedia@sltnet.lk www.womenandmedia.net

උදාහරණයක් වශයෙන් සුනාමි ව්‍යසනයෙන් අවතැන් වූ පුද්ගලයන් පිළිබඳ අප ඔබට මෙසේ කරුණු දක්වන්නෙමු. එම ව්‍යසන අවස්ථාවේ දී ගෘහමූලික පදනම මත එම මුදල් හා ද්‍රව්‍යමය ආධාර ලබාගත් බොහෝ බේබදු සල්ලාල ගෘහමූලික පුරුෂයන් එම ආධාර ද තම බේබදුකම් හා සල්ලාලකම්වලට යොදවමින් තවදුරටත් එම පවුල් අසරණ තත්ත්වයට පත් කළ ආකාරය ගැන පසුගිය කාලයේ අපට බොහෝ කරුණු අසන්නට, දකින්නට ලැබුණි. ගෘහ මූලිකයා යනු අනිවාර්යයෙන්ම පිරිමියා යන සංකල්පයෙන් මිදී යථාර්ථවාදීව කරුණු කාරණා ප්‍රකාශ කරන්නේ නම් වටනේ බව අපේ හැඟීමයි.

එම දේශනය තුළදීම **''තව අවුරුදු 10 ක් යන්න කලින් මේ රටේ කාන්තා රාජ්‍යයක් වේවි, අපේ පිරිමි දරුවෝ ටික ඉතිරි වෙන්නේ පළාත් සභා, ප්‍රාදේශීය සභා හා පාර්ලිමේන්තුවේ පමණයි''** යනුවෙන් ද ඔබ අදහසක් ඉදිරිපත් කර ඇත. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යතුමනි ඔබගේ මෙම ප්‍රකාශනයෙන් අපට හැඟනේනේ දේශපාලනය යනු පිරිමින් සතු කාර්යයක් ලෙසටය. දේශය පාලනය කිරීමට, ජන ජීවිතයට අදාළ වැදගත් තීන්දු-තීරණ ගැනීමට රටේ ජනගහණයෙන් හරි අඩකටත් වඩා සිටින කාන්තාවන්ට ද අයිතියක් ඇති බවද, ඒ ගැන ප්‍රබල මතයක් ගොඩ නැගී ඇති බව ද අපි මෙහිදී සඳහන් කිරීමට කැමැත්තෙමු.

මැතිවරණ නාමයෝජනා පත්‍ර සැකසීමේ දී එයින් 30% ප්‍රතිශතයක් කාන්තාවන් සඳහා ලබාදීමට නොයෙකුත් විද්වතුන්, ක්‍රියාකාරීන්, දේශපාලනඥයින් හා දේශපාලන පක්ෂ උත්සාහ දරමින් සිටින අතර පාර්ලිමේන්තු තේරුම් කාරක සභාවට ද එම යෝජනාව ඉදිරිපත් කර ඇත.

ප්‍රජාතන්ත්‍රවාදී රටක තීන්දු-තීරණගන්නා මට්ටම්වල අනිවාර්යයෙන්ම කාන්තා දායකත්වයක් පැවතිය යුතු අතර සමතුලිත සංවර්ධනයකට මෙය අනිවාර්ය සාධකයකි.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය (Gender) පිළිබඳ හරිහැටි දැනුවත් නොවීම නිසා කාන්තාවන්ට සමාජයේ නොයෙකුත් අසාධාරණකම් සිදුවන බව බොහෝ විද්වතුන්, සමාජය ක්‍රියාකාරීන් පවා පිළිගෙන, එම තත්ත්වය වෙනස් කිරීමට උත්සාහ දරන අවස්ථාවක ඔබ වැනි දරුවන්ට යහමඟ කියාදෙන කථිකාචාර්යවරයකු විසින් උසස් පෙළ දරුවන් සඳහා මෙවැනි දේශනයක් කිරීම කිසිසේත්ම ඔබට නොගැලපෙන්නක් බව අපේ හැඟීමයි.

මෙවැනි අගතිගාමී මතවාද පසකින් තබා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ මනා දැනුමක් රටේ සෑම උගත් නුගත් පුද්ගලයකුට ලබාගැනීමට ඉඩකඩ සලසා කාන්තාවන් පිළිබඳ ඇති සෘණවාදී, පසුගාමී අදහස්, මිත්‍යාමත දුරුකර සමාජය නිවැරදි මගට යොමු කිරීම ඔබ වැනි ආචාර්යවරුන්ගේ යුතුකමකි. ඒ සඳහා පාසැල් මට්ටමේ සිටම දරුවන් දැනුවත් කළ යුතු බව අපි සටහන් කරන්නෙමු.

ඔබ විසින් කළ කතාවක උපුටනයක් වූ 2009/08/20 දින දිවයින පුවත්පතේ පළවූ එම ලිපිය පිළිබඳ කරුණු පැහැදිලි කිරීමට මෙම ලිපිය ඉදිරිපත් කළා මිස ඔබ වැනි ගෞරවනීය, ජනතා ප්‍රසාදයට පත්වූ විශ්ව විද්‍යාල ආචාර්යවරයෙකු අපහසුතාවයට පත්කිරීම හෝ ඔබගේ සේවය ලඝුකොට තැකීම අපගේ අරමුණ නොවන බව ද අප මෙයින් අවධාරණය කරන්නෙමු.

මෙයට

**කාන්තාව හා මාධ්‍ය සාමූහිකය** 2009 අගෝස්තු 27 දින